# නේවාසිකාගාර සිසුන් සඳහා කෙරෙන විශේෂ දැනුම් දීම

# කැලණිය විශ්වවිද්‍යාලය

**රට තුළ උද්ගත වූ තත්ත්වය සැලකිල්ලට ගෙන කැලණිය විශ්වවිද්‍යාලයේ සහ සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2019.05.27 දින සිට නේවාසිකාගාරවල පහත සඳහන් ආරක්ෂක පියවර අනුගමනය කිරීමට තීරණය කර ඇති බව දැනුම් දෙන අතර ඒ සඳහා ඔබගේ පූර්ණ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.**

- නේවාසිකාගාර පහසුකම් ලබා ඇති සියලුම සිසුන් නිසි පරිදි නේවාසිකාගාරයේ ලියාපදිංචි විය යුතු ය.
- රාත්‍රී 8 ට පෙර සිසුන් තම නේවාසිකාගාරවලට පැමිණිය යුතු ය.
- නේවාසිකාගාර හිමිකම් නැති කිසිදු විද්‍යාර්ථියකු තම නේවාසිකාගාරවලට ඇතුල් කර නොගත යුතු ය.
- ආරක්ෂක හේතූන් මත අවශ්‍ය වුවහොත් ඔබගේ ගමන්මලු/පොත් බෑග් සහ හැඳුනුම්පත පරීක්ෂා කිරීමට ආරක්ෂක අංශවලට හා නේවාසිකාගාර ආරක්ෂක කමිටුවට අවස්ථාව සලසා දිය යුතු ය.
- නේවාසිකාගාරවලට බාහිර පුද්ගලයන් පැමිණෙන්නේ නම් ඒ පිළිබඳ ආරක්ෂක අංශය හා පූර්ණකාලීන උපශාලාධිපති දැනුවත් කළ යුතු අතර ඔවුන් හමු විය හැක්කේ නේවාසිකාගාර ගොඩනැගිල්ලෙන් පිටතදී පමණි.
- නේවාසිකාගාරයේ ආරක්ෂාව සඳහා පූර්ණකාලීන උපශාලාධිපතිවරුන් ගන්නා ආරක්ෂක ක්‍රියා මාර්ගවලට පූර්ණ සහය ලබා දිය යුතු අතර ආරක්ෂාව සම්බන්ධයෙන් සියලුම විද්‍යාර්ථීන් අවධානයෙන් සිටිය යුතු ය.
- නේවාසිකාගාර භූමියට ඇතුල් වීමට ඉඩ ලබා දෙන්නේ අවසරලත් වාහනවලට පමණි. වාහන හා යතුරු පැදි භාවිතා කරන සිසුන් අදාළ පීඨ කාර්යාලයෙන් ඉල්ලුම්පතක් ලබා ගෙන ශිෂ්‍ය සේවා අංශයෙන් වාහන අවසර පත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. වාහනයේ තම අවසර පත්‍රය ප්‍රදර්ශනය කළ යුතු ය.
- කිසිදු බාහිර පුද්ගලයකුට නේවාසිකාගාරයේ තම කාමරවල නවාතැන් ලබා නොදිය යුතු ය.

නියෝජ්‍ය උපකුලපති

කැලණිය විශ්වවිද්‍යාලය

2019.05.25